ශ්‍රී බුද්ධ වර්ෂ 2554-2555

රාජ්‍ය වර්ෂ 2011



# බුදුසරණ

## දෙලොස් මහා පොහොය දිනවල සිදුවූ ශාසනික වශයෙන් වැදගත් ඓතිහාසික සිදුවීම්

### දුරුතු පසළොස්වක පොහොය

තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ ගේ ප්‍රථම ලංකා ගමනය සිදුවූයේ ඓතිහාසික දුරුතු පෝ දිනකය. තුන්බෑ ජටිලයන් ප්‍රධාන දහසක් සච්වන් සදහම් මඟට හරවා ඔවුන් හැම අරි සඟ ගණ බවට පත්කොට වදළ බුදුපියාණන් වහන්සේ අනතුරුව හෙළදිව බිම්තැන්නේ මහවැලි ගඟ අසබඩ මිනිපේ නම් සරුදනව් පියසට ගුවන් ගැබින් පහළව සවනක් බුදු රැස් මාලාවන්ගෙන් දිලිහී වැඩහුන් සේක.

### නවම් පසළොස්වක පොහොය

සැරියුත් මුගලන් දෙනම අගසව් තනතුරු ලබන ලද්දේ ද, සම්බුද්ධ ශාසනවංශ කථාවෙහි ප්‍රථම මහා සංඝ සන්නිපාතය සිදුවූයේ ද නවම් පුණු පොහෝ දිනකය.

### මැදින් පසළොස්වක පොහොය

ලෝකාර්ථචර්යාවෙහි යෙදුණු බුදුන් වහන්සේ විසි දහසක් මහ සඟරුවන සමඟ රජගහනුවර සිට තමන් වහන්සේගේ උපන් ගමවූ කිඹුල්වත්පුරයට ගමනාරම්භ කළේ මැදින් පෝදිනකය.

### බක් පසළොස්වක පොහොය

බුදුපියාණන් වහන්සේගේ මහා ගුණ කඳ මනසට නංවන අසිරිමත් දිනයකි බක් පොහොය දිනය. මේ සුන්දර දිවයින තෙවැනි වරට ද බුදු සිරිපා පහසින් පිවිතුරු බවට පත්වූයේ ද, බුදුරජාණන් වහන්සේගේ සවනක් රැස් කඳින් නාගදීපය ආලෝකවත් වූයේ ද දහම් අමා මිහිරෙන් නොයෙක් දෙනා නිවී සැනසී ගියේ ද, බක් පුර පොහෝ දිනකදී ය.

### වෙසක් පසළොස්වක පොහොය

තිලොවග සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ලොව පහළවීම බුදුවීම, පිරිනිවන් පෑම යන අසිරිමත් මංගල කරුණු රැසකින් පූජනීයත්වයට, ඓතිහාසිකත්වයට පත් වුණු ශ්‍රී වෛශාඛ දිනය සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාවගේ පරම පූජනීය දිනයයි.

### පොසොන් පසළොස්වක පොහොය

අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ දඹදිව් තලයේ සිට හෙළදිව් තලයේ මිස්සක පව්වට සදහම් පණිවිඩය සමග වැඩම කළ ඓතිහාසික දිනය පොසොන් දිනයයි.

## පෝය ලබන ගෙවෙන වේලාවන් සහ සිල් සමාදන් විය යුතු දවස්

| | | |
|---|---|---|
| උඳුවප් මස පෝය | | |
| ජන. 03 සඳුදා අ.භා. 02.21 න් අමාවක ලබා 04 අඟහ.අ.භා 02.37 න් ගෙවේ. | 03 සඳුදා. | සිල් |
| දුරුතු මස පෝය | | |
| ජන 12 බදාදා පූ.භා. 03.53 න් පුර අටවක ලබා 13 බ්‍රහස්. පූ.භා. 06.05 න් ගෙවේ. | 12 බදාදා. | සිල් |
| ජන. 19 බදාදා පූ.භා. 05.19 න් පුර පසළොස්වක ලබා 20 බ්‍රහස්. පූ.භා. 02.51 න් ගෙවේ. | 19 බදාදා. | සිල් |
| ජන 26 බදාදා පූ.භා. 07.21 න් අව අටවක ලබා 27 බ්‍රහස්. පූ.භා. 05.44 න් ගෙවේ. | 26 බදාදා. | සිල් |
| පෙබ. 02 බදාදා පූ.භා. 06.28 න් අමාවක ලබා 03 බ්‍රහස් පූ.භා. 08.03 න් ගෙවේ. | 02 බදාදා. | සිල් |
| නවම් මස පෝය | | |
| පෙබ. 10 බ්‍රහස්. පූ.භා. 12.00 න් පුර අටවක ලබා 12 සෙන. පූ.භා. 01.24 න් ගෙවේ. | 11 සිකුරා. | සිල් |
| පෙබ. 17 බ්‍රහස්. අ.භා. 05.32 න් පුර පසළොස්වක ලබා 18 සිකුරා අ.භා. 02.05න් ගෙවේ. | 17 බ්‍රහස්. | සිල් |
| පෙ.බ. 24 බ්‍රහස්. අ.භා.05.32 න් අව අටවක ලබා 25 සිකුරා.අ.භා.04.46 න් ගෙවේ. | 24 බ්‍රහස්. | සිල් |
| මාර්. 03 බ්‍රහස්.අ.භා. 11.58 න් අමාවක ලබා 05 සෙන. පූ.භා. 02.17 න් ගෙවේ. | 04 සිකුරාදා. | සිල් |
| මැදින් මස පෝය | | |
| මාර්. 12 සෙන. අ.භා. 04.54 න් පුර අටවක ලබා 13 ඉරිදා අ.භා. 05.15 න් ගෙවේ. | 12 සෙන. | සිල් |
| මාර්. 19 සෙන. පූ.භා. 03.37 න් පුර පසළොස්වක ලබා එදිනම අ.භා. 11.41 න් ගෙවේ. | 19 සෙන. | සිල් |
| මාර්. 26 සෙන. පූ.භා. 05.37 න් අව අටවක ලබා 27 ඉරිදා පූ.භා. 05.52 න් ගෙවේ. | 26 සෙන. | සිල් |
| අප්‍රේ. 02 සෙන. අ.භා. 05.36 න් අමාවක ලබා 03 ඉරිදා අ.භා. 08.03 න් ගෙවේ. | 02 සෙන. | සිල් |
| බක් මස පෝය | | |
| අප්‍රේ. 11 සඳුදා පූ.භා. 05.53 න් පුර අටවක ලබා 12 අඟහ. පූ.භා. 05.08 න් ගෙවේ. | 11 සඳුදා. | සිල් |
| අප්‍රේ. 17 ඉරිදා. අ.භා. 12.02 න් පුර පසළොස්වක ලබා 18 සඳුදා පූ.භා. 08.16 න් ගෙවේ. | 17 ඉරිදා. | සිල් |
| අප්‍රේ. 24 ඉරිදා අ.භා. 07.53 න් අව අටවක ලබා 25 සඳුදා අ.භා. 09.02 න් ගෙවේ. | 25 සඳුදා | සිල් |
| මැයි. 02 සඳුදා පූ.භා. 10.24 න් අමාවක ලබා 03 අඟහ.අ.භා 12.20 න් ගෙවේ. | 02 සඳුදා. | සිල් |
| වෙසක් මස පෝය | | |
| මැයි 10 අඟහ. අ.භා. 02.46 න් පුර අටවක ලබා 11 බදාදා අ.භා. 01.06 න් ගෙවේ. | 10 අඟහ. | සිල් |
| මැයි 16 සඳුදා අ.භා. 07.43 න් පුර පසළොස්වක ලබා 17 අඟහ. අ.භා. 04.43 න් ගෙවේ. | 17 අඟහ. | සිල් |
| මැයි 24 අඟහ. පූ.භා. 11.32 න් අව අටවක ලබා 25 බදාදා අ.භා. 01.25 න් ගෙවේ. | 24 අඟහ. | සිල් |
| ජූනි 01 බදාදා පූ.භා. 01.38 න් අමාවක ලබා 02 බ්‍රහස්. පූ.භා. 02.32 න් ගෙවේ. | 01 බදාදා. | සිල් |
| පොසොන් මස පෝය | | |
| ජූනි 08 බදාදා. අ.භා. 08.44 න් පුර අටවක ලබා 09 බ්‍රහස්. අ.භා. 06.32 න් ගෙවේ. | 09 බ්‍රහස්. | සිල් |
| ජූනි 15 බදාදා. පූ.භා. 03.39 න් පුර පසළොස්වක ලබා 16 බ්‍රහස්. පූ.භා. 01.47 න් ගෙවේ. | 15 බදාදා. | සිල් |
| ජූනි 23 බ්‍රහස්. පූ.භා. 04.12 න් අව අටවක ලබා 24 සිකුරා. පූ.භා. 06.29 න් ගෙවේ. | 23 බ්‍රහස්. | සිල් |
| ජූනි 30 බ්‍රහස්. අ.භා. 02.50 න් අමාවක ලබා ජූලි 01 සිකුරා. අ.භා. 02.21 න් ගෙවේ. ජූනි. | 30 බ්‍රහස්. | සිල් |
| ඇසළ මස පෝය | | |
| ජූලි 08 සිකුරා. පූ.භා. 01.10 න් පුර අටවක ලබා එදිනම අ.භා. 10.53 න් ගෙවේ. | 08 සිකුරා. | සිල් |
| ජූලි 14 බ්‍රහස්. අ.භා. 12.49 න් පුර පසළොස්වක ලබා 15 සිකුරා. අ.භා. 12.14 න් ගෙවේ. | 14 බ්‍රහස්. | සිල් |
| ජූලි 22 සිකුරා. අ.භා. 09.22 න් අව අටවක ලබා 23 සෙන අ.භා. 11.39 න් ගෙවේ. | 23 සෙන. | සිල් |
| ජූලි 30 සෙන. පූ.භා. 02.03 න් අමාවක ලබා 31 ඉරිදා පූ.භා. 00.08 න් ගෙවේ. | 30 සෙන. | සිල් |
| නිකිණි මස පෝය | | |
| අගෝ. 06 සෙන. පූ.භා. 05.41 න් පුර අටවක ලබා 07 ඉරිදා පූ.භා. 03.44 න් ගෙවේ. | 06 සෙන. | සිල් |
| අගෝ. 12 සිකුරා. අ.භා. 11.49 න් පුර පසළොස්වක ලබා 14 ඉරිදා පූ.භා. 00.31 න් ගෙවේ. | 13 සෙන. | සිල් |
| අගෝ. 21 ඉරිදා අ.භා. 02.24 න් අව අටවක ලබා 22 සඳුදා අ.භා. 04.12 න් ගෙවේ. | 21 ඉරිදා. | සිල් |
| අගෝ. 28 ඉරිදා පූ.භා. 11.37 න් අමාවක ලබා 29 සඳුදා පූ.භා. 08.34 න් ගෙවේ. | 28 ඉරිදා. | සිල් |
| බිනර මස පෝය | | |
| සැප්. 04 ඉරිදා. පූ.භා. 11.58 න් පුර අටවක ලබා 05 සඳුදා පූ.භා. 10.39 න් ගෙවේ. | 04 ඉරිදා. | සිල් |
| සැප්. 11 ඉරිදා අ.භා. 01.13 න් පුර පසළොස්වක ලබා 12 සඳුදා අ.භා. 03.00 න් ගෙවේ. | 11 ඉරිදා. | සිල් |
| සැප්. 20 අඟහ. පූ.භා. 06.35 න් අව අටවක ලබා 21 බදාදා. පූ.භා. 07.30 න් ගෙවේ. | 20 අඟහ. | සිල් |
| සැප්. 26 සඳුදා. අ.භා. 08.22 න් අමාවක ලබා 27 අඟහ. අ.භා. 04.39 න් ගෙවේ. | 27 අඟහ. | සිල් |
| වප් මස පෝය | | |
| ඔක් 03 සඳුදා. අ.භා. 09.09 න් පුර අටවක ලබා 04 අඟහ. අ.භා. 08.44 න් ගෙවේ. | 04 අඟහ. | සිල් |
| ඔක්. 11 අඟහ. පූ.භා. 05.11 න් පුර පසළොස්වක ලබා 12 බදාදා පූ.භා. 07.37 න් ගෙවේ. | 11 අඟහ. | සිල් |
| ඔක්. 19 බදාදා. අ.භා. 08.55 න් අව අටවක ලබා 20 බ්‍රහස්. අ.භා. 08.45 න් ගෙවේ. | 20 බ්‍රහස්. | සිල් |
| ඔක්. 26 බදාදා. පූ.භා. 05.17 න් අමාවක ලබා 27 බ්‍රහස්. පූ.භා. 01.27 න් ගෙවේ. | 26 බදාදා. | සිල් |
| ඉල් මස පෝය | | |
| නොවැ. 02 බදාදා පූ.භා. 10.00 න් පුර අටවක ලබා 03 බ්‍රහස්. පූ.භා. 10.35 න් ගෙවේ. | 02 බදාදා. | සිල් |
| නොවැ. 09 බදාදා අ.භා. 11.20 න් පුර පසළොස්වක ලබා 11 සිකුරා. පූ.භා. 01.47 න් ගෙවේ. | 10 බ්‍රහස්. | සිල් |
| නොවැ. 18 සිකුරා. පූ.භා. 09.07 න් අව අටවක ලබා 19 සෙන. පූ.භා. 07.59 න් ගෙවේ. | 18 සිකුරා. | සිල් |
| නොවැ. 24 බ්‍රහස්. අ.භා. 03.03 න් අමාවක ලබා 25 සිකුරා. පූ.භා. 11.43 න් ගෙවේ. | 24 බ්‍රහස්. | සිල් |
| උඳුවප් මස පෝය | | |
| දෙසැ. 02 සිකුරා. පූ.භා. 02.43 න් පුර අටවක ලබා 03 සෙන. පූ.භා. 04.16 න් ගෙවේ. | 02 සිකුරා. | සිල් |
| දෙසැ. 09 සිකුරා. අ.භා. 06.26 න් පුර පසළොස්වක ලබා 10 සෙන. අ.භා. 08.05 න් ගෙවේ. | 10 සෙන. | සිල් |
| දෙසැ. 17 සෙන. අ.භා. 07.07 න් අවඅටවක ලබා 18 ඉරිදා අ.භා. 05.19 න් ගෙවේ. | 18 ඉරිදා. | සිල් |
| දෙසැ. 24 සෙන. පූ.භා. 02.03 න් අමාවක ලබා එදිනම අ.භා. 11.40 න් ගෙවේ. | 24 සෙන. | සිල් |

සිතුවම සරත් නන්දකුමාර

දෙලොස් මහා පොහොය දිනවල සිදුවූ ශාසනික වශයෙන් වැදගත් ඓතිහාසික සිදුවීම්

### ඇසළ පසළොස්වක පොහොය

බරණැස ඉසිපතනාරාමයේ දී දුකත්, දුකට හේතුවත් නිවනත් එය ලබන පිළිවෙතත් යන සත්‍ය සතර ලොව පළමුවරට දේශනා කළ දිනයයි, ඇසළ පෝදා.

### නිකිණි පසළොස්වක පොහොය

ඇසළ අව පෑළවිය දා භික්ෂූන් වහන්සේ පෙර වස් එළඹීමට නියමිත දිනයයි. නිකිණි පසළොස්වක පොහෝදා පොහොය කොට නිකිණි අව පෑලවිය දා පසු වස් එළඹීමයි, සසුන් පිළිවෙත වන්නේ.

### බිනර පසළොස්වක පොහොය

බුද්ධ නියමය අනුව භික්ෂූන් වහන්සේ විහාරාරාමයන්හි නිබඳව වැඩ වසමින් බණ භාවනාවල යෙදෙමින් ස්වකීය ශාසන පරමාර්ථ ඉටු කරගන්නා කාලයකි. මෙහෙණි සසුනේ ආරම්භය සිදුවිය.

### වප් පසළොස්වක පොහොය

වස්සාන සෘතුවේ මුල් තුන් මස භික්ෂූන් වස් වසා වැඩ සිටින කාලයයි. වස් සාර මාසයේ අන්තිම මාසය කඨින චීවර පූජා මාසයයි. එය චීවර මාසය නමින් ද ව්‍යවහාර කැරේ.

### ඉල් පසළොස්වක පොහොය

ශාසන ඉතිහාසයේ අනුස්මරණීය සිද්ධීන් කීපයකට මුල් වූ පොහොය දිනයකි. මෙතේ බෝසත්තුමා විවරණ ලැබීම, ප්‍රථම රහතන් වහන්සේ හැට නම ධර්ම ප්‍රචාරය සඳහා ගමන් ඇරඹීම පසු වස් පවාරණය කළ යුතු දිනය ද, සැරියුත් මහ රහතන් වහන්සේගේ පරිනිර්වාණය සිදුවීමද යන කරුණු රැසක් අනුස්මරණය කැරෙන්නේ ඉල් පෝදාය.

### උඳුවප් පසළොස්වක පොහොය

උඳුවප් පොහොය දින සිදුවූ ශ්‍රී සංඝමිත්තා මහරහත් මෙහෙණීන් වහන්සේගේ ලංකා ගමනය ගැන ලංකා මෙහෙණී සසුන ගැන, ජය ශ්‍රී මහා බෝ සමිඳුන් ගැන සිහි කරන කවර අයකුට වුවද ඇති වනුයේ මහා සැනසිල්ලකි.